**මැදගම ප්‍රාදේශීය සභාව**

**මොනරාගල දිස්ත්‍රික්කය**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 26 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් බුක්තිවිදින ඉඩම් කැබැලි 39ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2017 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ දහම්ගම ප්‍රජාශාලාව වැඩිදියුණු කිරීමට ගෙවා තිබුණු රු.1,392,781ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඇ) සභාව සතු ට්‍රැක්ටර් රථයක වැහි ආවරණය සකස්කිරීම සඳහා ගෙවා තිබුණු රු.67,500ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඈ) ප්‍රචාරණ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් වර්ෂය අවසානවන විට අයකරගත යුතු රු.27,950ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් සහ මුදල් හා සමාන දෑ යටතේ දැක්විය යුතු රු.745,527ක් වූ ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ඊ) දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.1,992,417ක ණය ශේෂයෙන් ඉදිරි ගිණුම් වර්ෂය තුලදී ගෙවිය යුතු රු.1,749,790ක් ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි.

**1.3.2** <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.169,387,720ක් වූ වත්කම් විෂයයන් 02ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකිවිය.

**1.3.3** <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158,161,162,163 හා 166 වගන්ති | 133,278 | හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| **(ආ)** | **1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| | (i) රීති අංක 193 | - | එක් එක් ආදායම් හා වියදම් විෂයයන් යටතේ වන ඉතිරිවීම් හා අතිරික්තයන් ඒ පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයන් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| | (ii) රීති අංක 214 | - | එක් එක් වර්ෂය අවසානයේදී අංක 203 දරන රීතිය මගින් විධිවිධාන සලසා ඇති ආකාරයේ සමීක්ෂණ මණ්ඩලයක් මගින් ගබඩා ද්‍රව්‍ය පිළිබඳ සත්‍යාක්ෂණයක්කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 22 දරන චක්‍රලේඛය | - | සභාව විසින් 2005 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකර තිබුණු අතර වසර 05කට වරක් වරිපනම් තක්සේරු කිරීමට කටයුතුකර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,458,867ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,191,382ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 892,538 | 1,126,073 | 1,059,156 | 141,826 | 745,538 | 908,149 | 846,469 | 167,486 |
| (ii) | කුලී | 14,109,301 | 15,149,541 | 14,992,056 | 158,084 | 14,974,963 | 14,200,432 | 14,122,732 | 78,300 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 552,400 | 573,670 | 573,670 | - | 512,600 | 457,918 | 457,918 | - |
| (iv) | වෙනත් ආදායම් | 7,788,550 | 11,881,795 | 8,184,511 | 3,697,284 | 6,605,100 | 9,971,586 | 8,173,880 | 1,797,707 |
| | **එකතුව** | **23,342,789** | **28,731,079** | **24,809,393** | **3,997,194** | **22,838,201** | **25,538,085** | **23,600,999** | **2,043,493** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රුපියල් මිලියන 28.7ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 24.8ක් පමණක් රැස්කර තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂයන්ට අදාල හිඟ වරිපනම් බදු රු.141,540ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට එම හිඟ බදුවලින් රු.53,166ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව හිඟ බදු අයකර ගැනීම් සියයට 38ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

### 2.2.4 කුලී

දීර්ඝ කාලීනව බදුදී තිබුණු කඩකාමර 142ක් 2013 වර්ෂයේ තක්සේරුකර තිබුණද, එම තක්සේරුව මත කුලී අයනොකර පැරණි කුලිය මත සියයට 40ක් එකතුකර කුලී අයකර තිබුණි. ඉහත තක්සේරුව සිදුකර වර්ෂ 5ක් පමණ ගතවී තිබුණද අදාල තක්සේරුව මත කුලී අය නොකිරීම නිසා රු.7,298,473ක ආදායමක් අහිමිවී තිබුණි.

### 2.2.5 ස්ථාවර දැන්වීම් පුවරු ගාස්තු

සභා බලප්‍රදේශයේ සවිකර තිබුණු දැන්වීම් පුවරු 11ක් වෙනුවෙන් රු.27,950ක ගාස්තු අයකරගෙන නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,726,834ක් හා මුද්දර ගාස්තු රු.1,869,200ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) <u>කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්</u>

(i) <u>ආදාහනාගාරය ඉදිකිරීම</u>

ඇස්තමේන්තු වටිනාකම රු.21,626,232ක් වූ ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු 2015 ජනවාරි 30 දිනට පෙර අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානවන විටත් ඉදිකිරීම් නිමකර ආදාහනාගාරය ප්‍රයෝජනයට ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) <u>මැදගම සම්මන්ත්‍රණශාලාව ඉදිකිරීම</u>

ඇස්තමේන්තු වටිනාකම රු.28,477,004ක් වූ මැදගම සම්මන්ත්‍රණශාලාවේ ඉදිකිරීම් කටයුතු 2015 ජනවාරි 14 දිනට පෙර අවසන් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානවන විටත් ඉදිකිරීම් නිමකර නොතිබුණි.

(ඇ) <u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජුනි 28 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා කසළ කළමනාකරණ වියදම පියවාගෙන නොතිබුණි.

(ඉ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 25 දින වනවිටත් සකස්කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) සභාව සතු සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලේ අංක 13 කඩකාමරය බදුදීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභාව විසින් 2015 හා 2016 වර්ෂවල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 39ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතුකර නොතිබීම නිසා රු.21,250ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඇ) අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/1/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ සිදුකර තිබුණු ඉදිකිරීම් 22ක් සම්බන්ධයෙන් සැලසුම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර අදාල ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබාදීමට හෝ නීතිමය කටයුතු සිදු කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

2015 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබුණු ගේජ් 28 රැලි තහඩු 96ක ඌණතාවය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.

**04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත නොකිරීම |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩලය අනුමතකර නොගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |